# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1910/4 - 2015 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා - 2015.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක 53

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සෑම වෙළෙන්දෙකු විසින්ම තම වෙළෙඳසැලෙහි/මධ්‍යස්ථානයෙහි ප්‍රකටව පෙනෙන කොටසක හෝ ස්ථානයක, පාරිභෝගිකයාට අවශ්‍යවේ නම්, ඔවුන් විසින් මිලදී ගනු ලබන කිසියම් හෝ භාණ්ඩයක බර, මිලදී ගැනීමට පෙර / පසු කිරා බැලීම සඳහා මිණුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් නිරවද්‍යතාවය ප්‍රත්‍යක්ෂණය කරන ලද තරාදියක් තැබිය යුතු බවට සියලු වෙළෙඳුන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2015 මැයි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

04 - 896


1A - PG 2437 — 206 (2015/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*